**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2018**

-----------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමණාකරනයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යකයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

**2. විගණන නිරීක්ෂණ**

-------------------

**(අ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

--------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 371 (2) | තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා ගෙන අදාල කාර්යය නිම වී දින 10 ක් ඇතුලත එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවද, 2018 වර්ෂයේදී නිලධාරීන් පහලොස් දෙනෙකු අවස්ථා 42 ක දී ලබාගත් එකතුව රු.152,230 ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 13 සිට දින 218 ක කාලපරාසයක් දක්වා ප්‍රමාද කර තිබුණි. | 2018 වර්ෂයට අදාලව සියළුම අත්තිකාරම් මේ වන විට පියවා ඇත. ඉදිරියේ ලබා දෙනු ලබන අත්තිකාරම් දින 10 ක් ඇතුලත අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. | කාර්යයන් නිම වූ විගස අතුරු අග්‍රිම පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 මාර්ගෝපදේශය | සේවකයින්/ නිළධාරීන් බඳවා ගැනීම හා උසස් කිරීම් සඳහා පැවතිය යුතු අවම සුදුසුකම් ඇතුලත් බඳවාගැනීමේ හා උසස්කිරීමේ කාර්ය පරිපාටියක් සකස් කර අනුමත කර ගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්ය පටිපාටිය සකස්කර අනුමැතිය සඳහා 2019 මැයි 23 දින අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ කාර්යය පරිපාටිය කඩිනමින් අනුමත කර ගත යුතු වීම. |
| (iii) | 2015 මැයි 25 දිනැති අංක PED 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය | සමාලෝචිත වර්ෂයේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රවාහන දීමනා හිමිකම් නොමැති MM1-1 වැටුප් කාණ්ඩය යටතේ සේවය කල මූල්‍ය කළමනාකරු, අභ්‍යන්තර විගණක, කළමනාකරු (නීති), කළමනාකරු (ඉඩම්) යන තනතුරු සඳහා හා අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති වෘත්තීය පුහුණු උපදේශක තනතුරක් දරන නිළධාරිණියකටද මසකට රු.50,000 බැගින් එකතුව රු.1,450,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2019.09.30 දිනැති ලිපිය මඟින් අභ්‍යන්තර විගණක, කළමනාකරු(නීති), කළමනාකරු(ඉඩම්) යන තනතුරු සඳහා ප්‍රවාහන දීමනාව ලබා දීමට විශේෂ අනුමැතියක් ලබා දී ඇත. | HM 1-1 වැටුප් කාණ්ඩයේ නිළධාරීන්ට පමණක් ප්‍රවාහන දීමනාව ලබාගත යුතු අතර නොඑසේනම් ඒ සඳහා විශේෂ අනුමැතියක් ලබාගත යුතුය. |
| (iv) | 2016 මාර්තු 17 දිනැති ජාතික අයවැය චක්‍රලේඛයේ 2.3. (ii) ඡේදය | ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වූ සුදුසුකම් ලබන සැපයුම්කරුවන්ගෙන් මෙහෙයුම් කල්බදු යටතේ වාහන ලබාගත වුවත් සංස්ථාවේ සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂක සඳහා පුද්ගලික ලියාපදිංචි කල වාහන 02 ක් ලබාගෙන ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.04 ක කුලියක් ගෙවා තිබුණි. | දුර ප්‍රමාණය කිලෝමීටර් 1000ට අඩු සහ ලියාපදිංචි නොකරන ලද වාහන ලබාගත යුතු බැවින් යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම ඉතා අපහසු වේ. කෙසේ වෙතත් මාසිකව රු.135,000 ක මුදලක් සංස්ථාවට ඉතිරිකර ගත හැකි වන පරිදි වාහන ලබාගෙන ඇත. | ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි ආයතනයන්ගෙන් පමණක් කල්බදු පදනම මත වාහන ලබා ගතයුතු වීම. |
| (v) | 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 5/2017 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ 01 ඡේදය | ස්ථිර පදනම මත බඳවාගන්නා ලද ජොෂ්ඨ මට්ටමේ නිළධාරීන් සඳහා ලබා දිය හැකි උපරිම මාසික වෘත්තීය දීමනාව රු.15,000 ක් වුවද, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද කළමණාකරු (නීති) සඳහා රු.40,000 බැගින් සමාලෝචිත වර්ෂයේ මාස 02 ක් සඳහා රු.80,000 ක දීමනාවක් ගෙවා තිබුණි. | 05/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව මෙම නිළධාරියාට වෘත්තීය දීමනාව සහ ඉහල වැටුප් ලබා නොදී අදාල සේවය ලබාගත නොහැක. නමුත් වර්තමානයේ 2016 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව ආරම්භක වැටුපේ ස්ථාපනය කර නීති නිළධාරියකු බඳවා ගැනීමට හැකි වී ඇත. | අනුමත සේවකයින්ට අනුමත වෘත්තීය දීමනාව පමණක් ගෙවිය යුතු වීම. |

(ආ) **කළමනාකරණ ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 1979 අංක 49 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධිත) පනතේ 07 (01) A උප වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සංස්ථාව සතු කිසිම නිශ්චල දේපලක් කුලියට දීම, බදුදීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකල යුතුබව සඳහන් වුවද, සංස්ථාවේ ඉඩම් 16 ක් හා ගොඩනැගිලි 02 ක් බදු දීමේදී අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන නොතිබුණි. | යථෝක්ත ගොඩනැගිලි වසර ගණනාවකට පෙර බදු දී ඇති හෙයින් අදාල ලිපිගොනු අධ්‍යනය නොකර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇද්ද නැද්ද යන්න නිසැකවම කිව නොහැක. මෙම බදුදීම් වලින් කිහිපයක් හැර සෙසු ඉඩම් සඳහා දැනටමත් අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇත. ඉතිරි ඉඩම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ මත කඩිනමින් කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | සංස්ථාවේ වත්කම් බදු දීමේදී අමාත්‍යවරයාගේ පූර්ණ අනුමැතිය ලබා ගත යුතු වීම. |
| (ii) | සංස්ථාව 2002 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලයේදී හෙක්ටයාර් 273.76 ක ඉඩම් 09 ක් බදු පදනම මත බාහිර පාර්ශවයන්ට ලබාදී තිබුණු අතර, ඒ සඳහා සංස්ථාවට අයවිය යුත රු.මි 26.53 ක බදු මුදලක් 2019 ඔක්තෝම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මේ වන විටත් ගෙවීමට අපොහොසත් වී ඇති බදු ගිවිසුම සම්බන්ධව නීතිමය උපදෙස් ගැනීම සඳහා අදාල අංශයට යොමු කර ඇත. කඩිනමින් මෙම කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | අදාල බදු මුදල් කඩිනමින් අයකර ගත යුතු වීම. |
| (iii) | සංස්ථාවට අයත් ඉඩම් 05 ක් ගිවිසුම් ගත වීමකින් තොරව සන්නිවේදන කුලුණු ඉදිකිරීම සඳහා බාහිර ආයතන හා පාර්ශවයන් වෙත ලබා දී තිබුණු අතර ඒ සඳහා අය විය යුතු රු.මි 24.05 ක හිඟ බදු මුදල් 2019 ඔක්තෝම්බර් 31 දින දක්වා අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම හිඟ බදු මුදල් වලින් වැඩි මුදලක් හිඟව ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් වන අතර, එය අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලිඛිත උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. බදු ගිවිසුම් කිහිපයක් කඩකර ඇති නිසා නීතිමය කටයුතු කිරීමට නීති අංශ වෙත යොමු කර ඇත. | හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගත යුතු වීම. |
| (iv) | සංස්ථාවට අයත් ඕපල්ගල වතුයාය 2002 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත බදු දීමට තීරණය කර පසුව එය අවලංගු කර තිබුණද, එම සමාගමෙන් 2002 වර්ෂයේදී ලබා ගත් රු.මි.4.48 ක අත්තිකාරම් මුදල 2019 ඔක්තෝම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | විගණන විමසුම හා එකඟ වේ. එවැනි මුදලක් අපවෙත ලබාදුන් බවට ලිඛිත ගිවිසුමක් නොමැත. කෙසේ වෙතත් සංස්ථාව වෙත එවැනි මුදලක් ගෙවා ඇති බව මූල්‍ය අංශ සනාථ කරයි. මෙම මුදල ගෙවීමට නීතිමය ප්‍රතිපාදන තිබේදැයි සොයා බැලිය යුතුය. | අදාල අත්තිකාරම කඩිනමින් පියවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (v) | සංස්ථාව විසින් බදු පදනම මත බාහිර පාර්ශවන් ලබා දී ඇති ඉඩම් අක්කර 29 ක් හා ගොඩනැගිලි 3 ක් බදුකරුවන් විසින් අතහැර දමා තිබුණු අතර, එම ගිවිසුම් අවලංගු කර රු.මි 5.17 ක හිඟ බදු මුදල් අයකර නව ගිවිසුම් යටතේ නැවත බදුදීමට 2019 ඔක්තෝබර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | මෙම බදු ගැනුම්කරුවන් විසින් අත්හැර දමා තිබුණු ඉඩම් සහ ගොඩනැගිලි සඳහා බදු ගිවිසුම් අවලංගු කිරීමට සහ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නීති අංශ වෙත යොමු කර ඇති අතර, ඒ අනුව අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම් අවලංගු කර හිඟ බදු මුදල් අයකර අදාල වත්කම් සම්බන්ධයෙන් විකල්ප ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (vi) | හුන්නස්ගිරිය වතුයායේ සංස්ථාවට අයත් ඉඩමක් “හුන්නස් ෆෝල්” නමින් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට වතු සමුපකාර සමිතියකට භූමි ප්‍රමාණය හඳුනා ගැනීමකින් තොරව, ලිඛිත ගිවිසුමක් නොමැතිව ලබා දී තිබුණු අතර, අදාල ව්‍යාපෘතියෙන් ලබන ආදායම සලකා බැලීමකින් තොරව එම ආදායමෙන් මුළු වියදම් අඩුකල පසු ලාභයෙන් කොටසක් පමණක් ලබා ගැනීම හේතුවෙන් විශාල ප්‍රමාණයක ආදායමක් අහිමි වී තිබුණි. | හුන්නස්ගිරිය වතු අධිකාරි සමඟ සාකච්ඡා කොට රජයේ තක්සේරු අනුව අයවිය යුතු මාසික කුලිය අඩංගු ලිඛිත ගිවිසුමක් සකස් කිරීමට කටයුතු කර ඇත. මාසික කුලිය සහ අනෙකුත් ප්‍රතිලාභ ද ගිවිසුමට ඇතුලත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | සංස්ථාවට අයත් වත්කම් බාහිර පාර්ශවයන්ට ලබා දීමේදී ලිඛිත ගිවිසුමක් යටතේ වඩා වාසි දායක කොන්දේසි මත දිය යුතු වීම. |
| (vii) | මූලික ශක්‍යතා අධ්‍යනයකින් තොරව 2017 හා 2018 වර්ෂ වල සංස්ථාවට අයත් වතු 8 ක නිෂ්පාදනය කර තිබුණු රු.මි. 3.34 ක් පිරිවැය වූ මදුරුකුරු 634,595 ක් අලෙවිකර ගැනීමට නොහැකිව ප්‍රධාන කාර්යාලයේ හා වතු කිහිපයක ගබඩා තුල ගොඩගසා තිබුණු අතර, මෙම තොග මේ වනවිට යල් පැනීමට ආසන්න තත්ත්වයේ පවතී. | සමාන නිෂ්පාදන හා සැසඳීමේදී මේවායේ මිල ගණන් ඉහල මට්ටමක පැවතීමත්, මදුරු කුරු පිළිබඳව ජනතාවගේ දැනුම අඩු බවත්, ප්‍රචාරණය ප්‍රමාණවත් නොවීමත්, අතරමැදියන් ඉහල වට්ටම් ඉල්ලීමත්, වැනි හේතු නිසා තොග අලෙවි නොවී ඉතිරිව පවතින අතර, සාමාජීය ප්‍රතිලාභ ගැන වැඩි සැලකිල්ලක් යොමු කොට අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. | විශාල පරිමාණ නිෂ්පාදනයන් කිරීමට පෙර මූලික වෙළෙඳපොල ශක්‍යතා අධ්‍යකයක් සිදු කර වෙළෙඳපොල ඉල්ලුම හඳුනාගත යුතු වීම. |
| (viii) | 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරණ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත අනුව, දායක මුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාව අදාල කර ගත යුතු වුවත්, සංස්ථාවෙහි සේවක දායකත්වය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මි 1.48 ක දායක මුදල් අඩුවෙන් ගෙවා තිබුණි. | වර්තමානයේ සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිභාර අරමුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාව අදාල කරගනු ලබයි. | ජීවන වියදම් දීමනාවද අදාල කර ගෙන අර්ථසාධක දායක මුදල් ගෙවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ix) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාරව සභාපතිවරයාගේ මාසික ඉන්ධන දීමනාව ලීටර 170 ක් වුවත්, එම සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂය සඳහා රු.91,260 ක් වටිනා ඉන්ධන ලීටර 780 ක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | 2019.02.07 වන දින සිට අදාල නිවැරදි කිරීම් කර ඇත. | අනුමත සීමාව ඉක්මවා ඉන්ධන ලබාගැනීමේදී අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වීම. |

**(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වර්ෂ 100 කට වඩා පැරණි හෙක්ටයාර් 1523 ක තේ වගාව ඉවත්කර නැවත වගාවන්ට යොමු නොවීම නිසා 2017 වර්ෂයේ කිලෝග්‍රෑම් 1,595 ක් වූ ශ්‍රී ලංකාවේ හෙක්ටයාරක සම්මත වාර්ෂික සමාන්‍ය නිමි තේ එලදා ඉලක්කයට ලඟා වීමට නොහැකි වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී සංථාවට අයත් වතු 13 ක හෙක්ටයාරයක වාර්ෂික තේ එලදාවේ සාමාන්‍ය කිලෝග්‍රෑම් 200 ත් කිලෝග්‍රෑම් 863 ත් අතර පරාසයක පැවතුණි. | මෙම වතු දහතුනේම මැදරට තේ ගණයට ගැනෙන China Jat වර්ගයේ අවුරුදු 100 කට වඩා පැරණි ඇට තේ වගාව වෙනුවට එලදාව වැඩි රිකිලි තේ වගාවට යොමු විය යුතු වුවද, ඒ සඳහා හෙක්ටයාරයකට වැයවන රු.මි. 7-8 පිරිවැය සහ පාංශු සංරක්ෂණයට මෙන්ම පොහොර යෙදීමට සංස්ථාවේ මූල්‍ය අර්බුදය බාධාවක් වී ඇති අතර, කම්කරු හිඟය ද අස්වැන්න අඩු වීමට බලපා ඇත. | ඉතා පැරණි වගාවන් ඉවත් කර එලදාව වැඩි නැවත වගාන්ට යොමු වීම කඩිනම් කල යුතු වීම. |
| (ii) | සංස්ථාවට අයත් ඉඩම් හෙක්ටයාර් 1163 ක් බාහිර වැවිලිකරුවන්ට ලබා දී තිබුණු අතර, එම ඉඩම් ප්‍රමාණයෙන් කර්මාන්තයේ පවතින හෙක්ටයාරයක සම්මත සමාන්‍ය එලදාව ලෙස කිලෝග්‍රෑම් 1,854,985 ක දළු අස්වැන්නක් ලබා ගත යුතු වුවද, බාහිර වැවිලිකරුවන් විසින් සංස්ථාවට ලබා දී තිබූ දළු අස්වැන්න කිලෝග්‍රෑම් 102,507 කට හෙවත් සියයට 6 කට සීමා වී තිබුණි. මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සංස්ථා පාලන අධිකාරිය 2019 ඔක්තෝම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | දළු කිලෝවක් සඳහා බාහිර පාර්ශවයන්ට ලබාදෙන මුදල ප්‍රමාණවත් නොවීම නිසා ඔවුන් උදාසීන වීම අස්වැන්න අඩු වීමට බලපා ඇත. මීට අමතරව අස්වැන්න ලබා ගැනීමට සංස්ථාව පවරා දී ඇත්තේ පැරණි ඇට තේ වගාව පමණක් ඇති "සී" ක්ෂේත්‍රයන් වීමද තවත් හේතුවකි. | සංස්ථාවට අයත් ඉඩම් වලින් සම්මත සමාන්‍ය එලදාවක් ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| (iii) | තේ කිලෝග්‍රෑම් එකක සම්මත නිෂ්පාදන පිරිවැය රු.475 ක් විය යුතු වුවත්, සංස්ථාවේ එම අගය රු. 500 -717 ක් අතර පරාසයක පැවතීම හේතුවෙන් නිෂ්පාදන ඒකකයක දායකත්වය සෘණ රු.2 ත් සෘණ රු.300 ත් අතර පරාසයක පැවතුණි. | කාර්යමණ්ඩල වැටුප් වැඩිවීමත්, තේ වල ගුණත්වය අඩු වීම නිසා කිලෝවක විකුණුම් මිල අඩු වීමත් මෙම තත්ත්වයට හේතුවක් වූ අතර, ගුණත්වය අඩු වීමට සංස්ථාවේ මූල්‍ය අර්බුදය හමුවේ කලට වේලාවට පොහොර නොයෙදීම හේතුවක් වී තිබුණි. | නිෂ්පාදන පිරිවැය පාලනය කර විකුණුම් මිල ඉහල නංවාගෙන දායකය ඉහල නංවා ගැනීමට කඩිනමින් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iv) | සංස්ථාවේ වතුයායන් 14කට අදාලව සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 10,520ක් වුවද, ඉන් වගාවන් සඳහා දායක කරගෙන ඇති තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 6208 පමණක් වීම හේතුවෙන් සංස්ථාව සතු ඉඩම් හෙක්ටයාර් 4312 ක් එනම් සියයට 41 ඉඩම් ප්‍රමාණයක් වගා කටයුතු සඳහා දායක කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම වගා නොකරන සියයට 41 ක ඉඩම් ප්‍රමාණය නකල්ස් රක්ෂිතයේ පිහිටා තිබීම මෙම තත්ත්වයට හේතු වී තිබේ. | නිෂ්කාර්ය භූමි ප්‍රමාණය අවම කරගෙන සමස්ත භූමියම වගා කටයුතු සඳහා යොමුකල යුතු වීම. |

**(ඇ) වත්කම් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව සතු තේ කර්මාන්තශාලා දහයෙන් හතක් අක්‍රීය තත්ත්වයේ පැවති අතර අක්‍රීය කර්මාන්තශාලා තේ නිෂ්පාදන කටයුතු සඳහා දායක කරගැනීමට හෝ බදු දීමට කටයුතුකර නොතිබුණි. | අලකොල්ල සහ ගල්පිල්ල යන කර්මාන්ත ශාලා ගින්නෙන් විනාශ වී ඇත. තවත් කර්මාන්ත ශාලා 05 ක් අක්‍රීය තත්ත්වයේ පවතී. අක්‍රීය තත්ත්වයේ පවතින හාගල කර්මාන්ත ශාලාව නවීකරණය කර නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට සාකච්ඡා කරමින් පවතී. | වසා දමා ඇති කර්මාන්ත ශාලා කඩිනමින් සක්‍රීය කල යුතු වීම. |

**(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් සහ ඇල්කඩුව වැවිලි සමාගමෙන් වර්ෂ 22 ක සිට අයවිය යුතු රු.මිලියන 44.66 ක මුදලක් අයකර ගැනීමට 2019 ඔක්තෝබර් 31 දින වන විටත් කටයුතුකර නොතිබුණි. | ඇල්කඩුව වැවිලි සමාගමෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොහැකි වීම සම්බන්ධව එකඟ වන අතර ඒ සඳහා සිහි කැඳවීම් ලිපි ඉදිරිපත් කර ඇත. ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් අයවිය යුතු මුදලට වඩා අප එම ආයතනයට ගෙවියයුතු මුදල වැඩි හෙයින් එම මුදල අයකර ගැනීමට කටයුතු කර නොමැත. | අදාල මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ii) | ජනතා වතු සංවර්ධන මණ්ඩලය ඇතුළු රාජ්‍ය ආයතන 07 කට වර්ෂ හතකට වැඩිකාලයක සිට ගෙවිය යුතු රු.මිලියන 227.67 ක මුදල පියවීමට 2019 ඔක්තෝබර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | විගණන විමසුම හා එකඟවේ.සංස්ථාවේ පැවති මූල්‍ය අපහසුතාවය මත එම මුදල් පියවීමට නොහැකි වී ඇත. | අදාල මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කල යුතු වීම. |

## (ඊ) කාර්යය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වැවිලි සංස්ථාවේ අනුමත තනතුරු 38 ක කාර්ය මණ්ඩලය 89 ක් වුවද, එම කාර්යමණ්ඩල ඉක්මවා සහකාර වතු අධිකාරීවරුන් 6 දෙනෙකු, කළමණාකාර සහකාර නිළධාරීන් 05 දෙනෙකු සහ කොන්ත්‍රාත් පදනම මත රියදුරන් 03 දෙනෙකු බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 2.72 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | සංස්ථාව සතු වතුයායන් ප්‍රමාණය 03 කින් වැඩි වීම හේතුවෙන් හදිසි අවශ්‍යතාවයක් මත වතු අධිකාරීවරුන් බඳවා ගන්නා ලදි. සභාපතිවරයාට සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට රියදුරන් ලබා දීම සඳහා සහ ප්‍රධාන කාර්යාලයේ මෝටර් රථ ප්‍රමාණයට අනුව රියදුරන් ලබා දීම සඳහා රියදුරන් බඳවාගෙන ඇත. | අනුමත කාර්යමණ්ඩල ඉක්මවා සේවකයන්/ නිළධාරීන් බඳවා ගැනීම නොකල යුතු වීම. |
| (ii) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත නොකල තනතුරු අටක් සඳහා ස්ථිර පදනම මත නිළධාරීන් හතර දෙනෙකුද, කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් හතර දෙනෙකුද බඳවාගෙන ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 5.29 ක වැටුප් පිරිවැයක් දරා තිබුණි. | ඉහත (අ) යටතේ පිළිතුරු සපයා ඇත. | අනුමත තනතුරු සඳහා පමණක් නිළධාරීන්/ සේවකයින් බඳවාගත යුතු වීම. |
| (iii) | ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2 ඡේදය ප්‍රකාරව යම් තනතුරක පුරප්පාඩුවක් ඇති වූ වහාම එම තනතුර සඳහා ස්ථිර නිළධාරියෙකු පත්කල යුතු වුවත්, 2008 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින කළමණාකරු (නීති) තනතුර සඳහා ස්ථිර පදනම මත නිළධාරියෙකු පත් කර නොතිබුණි. | නීති කළමනාකරුවකු බඳවා ගැනීම සඳහා 2019.10.11 වන දින ඩේලි නිවුස් සහ දිණමින යන පුවත්පත් වල ප්‍රසිද්ධ දැන්වීමක් පල කිරීමට කටයුතු කර ඇත. | පුරප්පාඩු වූ තනතුරු සඳහා ස්ථිර නිළධාරීන්/ සේවකයින් කඩිනමින් බඳවාගත යුතු වීම. |
| (iv) | අදාල බළධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව තිස්අට දෙනෙකු සඳහා 2017 වර්ෂයේදී හා 2018 වර්ෂයේදී වැටුප් වර්ධක 2 සිට 5 දක්වා ප්‍රමාණයක් ලබාදීම හේතුවෙන් රු.මිලියන 1.22 ක අමතර වැටුප් පිරිවැයක් සමාලෝචිත වර්ෂයේදී දැරීමට සිදු වී තිබුණි. | 2017.05.31 දිනට සංස්ථාව ලද රු.මිලියන ගණනක ලාභය හේතුවෙන් සේවකයන් දිරි ගැන්වීම සඳහා 2017.08.17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අමතර වැටුප් වර්ධක ලබා දීම සිදු කරන ලදි. | වැටුප් වර්ධක ලබා දීමේදී ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදය අනුව කටයුතු කල යුතු වීම. |